---

**කළුතර ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 15 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කළුතර ප්‍රදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ගබඩා තොග නිකුත් කිරීම් වූ රු.8,579,719 ක් ආදායම් හා වියදම් ගිණුමට වර්ෂයේ වියදම ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට වර්ෂයේ ගබඩා තොග මිලදී ගැනීම් වූ රු.7,685,003 ක් ආදායම් හා වියදම් ගිණුම හර කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 56,115,394 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,553,232 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,504,642 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) 185 අනුව සභාවේ මුදල් ශේෂය සභාපතිවරයා විසින් වරින් වර පිරික්සා බැලිය යුතු අතර පහසුවෙන් මුදාහැරිය හැකි මුදල් ප්‍රමාණයක් සභාවේ එකගත්වය ඇතිව ආයෝජනය කළ යුතු වුවත් 2011 දෙසැම්බර් 31 දිනට රු.13,178,737 ක මුදල් ශේෂයක් පොදු ගිණුමේ පැවතියද ඉන් කොටසක් හෝ ආයෝජනය කිරීමට සලකා බලා නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 3,102 | 2,158 | 3,385 |
| (ii.) | බදු කුලී | 110 | 87 | 48 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 713 | 663 | 110 |

2:3:2 වරිපනම් බදු

2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.3,033,990 ක් විය. ඉන් කොළඹ පාර වම්පැත්ත කොට්ඨාශයට අයත් වරිපනම් බදුකරුවන් 121 කගෙන් රු.2,000 ට වැඩි හිඟ ශේෂ පැවති බදුකරුවන් 20 ක් වූ අතර හිඟ ශේෂය රු.78,405 ක් විය.

2.3.3 ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, බලපත්‍ර ගාස්තු

2012 වර්ෂයට අදාලව ආයතන 186 කින් ව්‍යාපාර බදු රු.181,210 ක් ද, ආයතන 41 කින් කර්මාන්ත බදු රු.20,780 ක්ද, ආයතන 38 කට අදාලව බලපත්‍ර ගාස්තු රු.11,050 ක්ද විගණිත දිනය වූ 2013 මැයි 23 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:3:4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 33,783,338 |
| (ii) | මුද්දර ගාස්තු | 8,500,000 |

2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අංක 37-9779 දරන වාහනය 2007 ජූනි 14 දින සිටද, මාර්ග තලනය 2009 ජූලි 29 දින සිටද උපයෝජනයකින් හා අළුත්වැඩියා කිරීමෙන් තොරව ගාල් කර තිබුණි.

2:5 අවිධිමත් ගනුදෙනු

2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව සභාවේ ලේකම්ගේ පෞද්ගලික දුරකථන බිල් පත් සඳහා 2011 ජනවාරි සිට විගණිත දිනය වූ 2013 අප්‍රේල් දක්වා රු.91,191 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

2011 විමධ්‍යගත අරමුදල් යටතේ රු.1,940,000 ක මුදලක් නාගොඩ ඇටවිල පොදු සුසානභූමියේ ආදාහනාගාරය ඉදි කිරීම සඳහා අනුමත වී තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ 2011 නොවැම්බර් 23 දින

අදාල කාර්යය මසකින් නිම කිරීමට ගිවිසුමකට එළඹී තිබුණි. කර්මාන්තය වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දින රු.838,315 ක් විමධ්‍යගත අරමුදලින්ද 2012 ජුනි 22 දින රු.525,333 ක් සභා අරමුදලින්ද ගෙවා තිබුණි. 2012 මැයි 21 දින කරන ලද භෞතික පරික්ෂණයේදි අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්මාන්තයේ වැඩ සම්පූර්ණයෙන් නිම වී නොතිබුණි.

(ආ) ආදාහනාගාරයේ බිත්ති බැඳ වහලය පමණක් ඉදි කර තිබූ අතර පිටත බිත්තිය පමණක් සම්පූර්ණයෙන් වප්පාරුව ගසා ඇතුළත අඩි අටක් පමණ උසට වප්පාරුව ගසා තිබුණද බිත්තිවල හොඳ නිමාවක් නොතිබුණි.

(ඇ) කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට පියවර ගෙන නොතිබූ අතර ඉදිකර තිබූ කොටස් වල් බිහිවී විනාශ වෙමින් පැවතුණි.

2.7 මෙහෙයුම්/ කළමනාකරණ අකර්යක්ෂමතා

---

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සේවයෙන් පහ කර තිබූ, ස්ථාන මාරු වී ගිය, වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.345,570 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටු කර ගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබු අතර ක්‍රියාකාර් සැළැස්මක් ද සකස් කර නොතිබුණි. ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

---

1988 ප්‍රාදේශීය සභා රීති සංග්‍රහයේ 5 රීතියේ 7 උප රීතිය ප්‍රකාරව මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගැනීම සභාපතිගේ කාර්යභාරයක් වුවද එසේ කටයුතු කර නොතිබුණි.

---

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වාහන පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය